කොළඹ දිසා අධිකරණයේ දිය

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය,
එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
කොළඹ 01.

පැමිණිලිකරු

නඩු අංකය: 15322/එම්.ආර්.

- එදිරිව -

නිහාල් ශ්‍රී අමරසේකර,
කොමින්ඩිටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ්,
අංක: 167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

විත්තිකරු

වර්ෂ 1994 ක්වූ දෙසැම්බර් මස 15 වන දින දිය.

ස්වකීය නීතිඥ හුසේන් අහමඩ් මහතා මගින් පෙනී සිටින ඉහත නම් සඳහන් පැමිණිලිකරුගේ ප්‍රති උත්තරයෙන් පහත සඳහන් පරිදි ප්‍රකාශ කෙරේ.

01. මෙහි මින්මතු ප්‍රකාශිතව පිළිගෙන ඇති ඒවා හැර හා විනා උත්තරයේ අන්තර්ගත සියලු හා එක් එක් සම්ප්‍රකාශ පැමිණිලිකරු අපලාපනය කරයි. පැමිණිල්ලේ සම්ප්‍රකාශ යළි එපරිදිම අවධාරණය කරන පැමිණිලිකරු උත්තරයේ අන්තර්ගත නොයෙකුත් අපලාපනයක් සම්බන්ධයෙන් විසදිය යුතු ප්‍රශ්න නගයි.

02. පැමිණිලිකරු කියා සිටින්නේ,

(අ) උත්තරය සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධානාත්මක විධිවිධාන වලට අනුකූලව නොමැති බවත්,

(ආ) පැමිණිල්ල අපහැදිලි බව හා පැමිණිලිකරු විසින් පැමිණිල්ලේ දක්වා ඇති නිශ්චිත චෝදනා අවුල් කිරීමේ වෑයමක් ලෙසින් අදාල සම්බන්ධකමක් නොමැති අසත්‍ය කරුණු උත්තරයේ අන්තර්ගත බවත්, එය විසදිය යුතු කාරණා සහ මෙම නඩුවේ කරුණු වලින් හිතාමතා පිටපැනීමට ගෙන ඇති උත්සාහයක් බවත්,

(ඇ) උත්තරයේ සම්ප්‍රකාශ ද්වේශ සහගතව දුෂ්ඨ චේතනාවෙන්

2 පිට...

කර ඇති ඒවාද වන අතර පැමිණිලිකරු විසින් විත්තිකරුට කර ඇති චෝදනා වලට සම්පූර්ණයෙන්ම ආගන්තුක වූ හා අදාල වන පැමිණිලිකාර සමාගමේ සභාපති සමග පෞද්ගලික වෛරයක ස්වභාවයේ ඒවාද වේ.

(ඈ) සියලුම ඊතියා ප්‍රති ඉල්ලීම් හිමිකම් පෑමේ වර්ගයේ, ස්වභාවයේ හෝ තත්වයේ ඒවා නොවන අතර, ඒවා තබා ගැනීමට හා පවත්වාගෙන යාමට නොහැකි ඒවා වන අතර, පැමිණිලිකරු ඉල්ලා සිටින අලාභ අයකර ගැනීම කෙරෙහි බාධා කිරීමට, බියවැද්දීමට හා ප්‍රමාද කිරීමට ගත් උත්සාහයකින් ද්වේශ සහගත ලෙස කරනු ලැබූ ඒවා වේ.

(ඉ) කෙසේ වුවද ප්‍රති ඉල්ලීම් තබා ගැනීමට හා පවත්වාගෙන යාමට විත්තිකරුට සිද්ධිමය වශයෙන් හෝ නීතිමය වශයෙන් අයිතියක් නැත.

(ඊ) උත්තරයේ ආයාචනා කර ඇති සහන නීතියෙන් මුළුමනින්ම අවසංකල්පයෙන් යුක්ත වන අතර, ඒවා විත්තිකරුගේ දුෂ්ට හා ද්වේශ සහගත චේතනාව හෙළිදරව් කරන වග දිස්වේ.

(උ) උත්තරයේ සම්ප්‍රකාශන සහ ආයාචනා කර ඇති සහ සිවිල් නඩු විධාන සංග්‍රහයේ දක්වා ඇති ආකාරයට හා පිළිවෙතට මුළුමනින්ම එකග නොවේ.

(ඌ) 3 වන නඩු නිමිත්ත නීතියට හෙළිදරව් වූ කිසිදු නඩු නිමිත්තක් අනාවරණය නොකරන බැවින් 3 වන ප්‍රති ඉල්ලීමෙහි දක්වා ඇති කිසිදු අලාභයකට විත්තිකරු නීතියෙන් හිමිකම් නොලබයි.

(එ) ප්‍රති ඉල්ලීම්වල ස්වභාවයෙන් ආයාචනා කර ඇති කිසිදු ප්‍රකාශනයකට විත්තිකරු නීතියෙන් හිමිකම් නොලබයි.

(ඒ) ඉහත කී හේතූන් එකක් හෝ කිහිපයක් මත උත්තරය මූලාරම්භයේම ප්‍රතික්ෂේප කලයුතුය සහ/හෝ අවම වශයෙන් එය නිසි පරිදි සකස් කිරීම සඳහා සංශෝධනය කිරීමට ආපසු භාරදිය යුතුය.

03. ඉහත කී දැයට අගති රහිතව උත්තරයේ නොයෙකුත් සම්ප්‍රකාශ පැමිණිලිකරු මෙසේ පිළිතුරු සපයයි.

04. උත්තරයේ 5 හා 6 ඡේදවල අන්තර්ගත සම්ප්‍රකාශ අපලාපනය කරන පැමිණිලිකරු ආයෝජන ගිවිසුම ප්‍රකාර කෝරිනල් ඇන්ඩ් කම්පනි ලිමිටඩ්

3 පිට...{

පැමිණිලිකාර සමාගමේ කොටස් වලින් 52.62% ක් අයත් බවත් ඉන් 51% රාජ්‍ය ඇපය ක්‍රියාත්මක හා වලංගු වන කාලය එළඹෙන තුරු රජය විසින් දරා සිටීම සඳහා රජයට පැවරූ බවත් කියා සිටී. එකී ආයෝජන ගිවිසුමට පැමිණිලිකාර සමාගම පාර්ශවකරුවකු නොවන නමුත් එය රජය හා සමාගමේ බහුතර කොටස්කරුවා අතර ක්‍රියාත්මක වන ගිවිසුමකි.

05. උත්තරයේ 8, 9, හා 10 ඡේදවල අන්තර්ගත සම්ප්‍රකාශ වලට පිළිතුරු දෙමින් පහත සඳහන් හේතූන් මත පැමිණිලිකරු ඒවා අපලාපනය කරයි.

(අ) 1978 පමණ සිට කෝනල් සමාගම් සමූහයේ කළමනාකාර හා ආදායම් බදු උපදේශකයකු ලෙසත් 1982 දෙසැම්බර් සිට එකී සමාගම් සමූහයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙසත් සේවයේ නිරත කරන ලදී.

පැමිණිලිකාර සමාගමේ ප්‍රධාන ප්‍රවර්ධකයා කෝනල් ඇන්ඩ් කම්පනි ලිමිටඩ් වූ අතර පහත සඳහන් ලේඛණ මෙහිම කොටස් වශයෙන් අයැද සිටී.

"x1" වශයෙන් කරන ලද වෘත්තිමය ගාස්තු වශයෙන් ලාභ වලින් ප්‍රතිශතයක් සහ ඒ වෙනුවෙන් රු.50,000/- ක අවම ගෙවීමක් සහ තවත් කවර හෝ නව ව්‍යාපෘතින්හි හිමිකාරත්වයෙන් 25% ක් ඉල්ලා සිටින විත්තිකරුගේම අත් අකුරෙන් ලියන ලද 1982.09.15 දින දරණ ලියවිල්ල.

"x2" වශයෙන් ලකුණු කරන ලද විත්තිකරු විසින් කෝනල් සහ සමාගමට යවන ලද 1983 දෙසැම්බර් 27 දින දරණ ලිපිය.

"x3" වශයෙන් ලකුණු කරන ලද විත්තිකරු විසින් කෝනල් සමාගමට යවන ලද 1984 සැප්තැම්බර් 27 දින දරණ ලිපිය.

"x4" වශයෙන් ලකුණු කරන ලද හිල්ටන් ව්‍යාපෘතියට අදාලව පහත දක්වා ඇති පරිදි සඳහන් කෝනල් සහ සමාගමේ ඔහුගේ දායකත්වය පිළිබඳ විත්තිකරු විසින් කෝනල් යන සමාගමට එවන ලද 1984 සැප්තැම්බර් 27 වන දින දරණ ලිපිය.

"මූල්‍යය පිඹුරුපත් සැකසීම් පමණක් නොව 51% ක හිමිකාරත්වයක් තහවුරු කිරීම ඇතුළුව කෝනල් ඇන්ඩ් කම්පනි

4 පිට...

ලිමිටඩ් සමාගමට විශාල "ආදායම් බදු ආවරණ" තත්වයක් ඇතිවන ප්‍රතිඵලයක් ද ලබාදෙන ඉඩම් බද්ධ ප්‍රාග්ධනයට හැරවීමේ උපාය සැකසීම ආරම්භ කරන ලදි"

(ආ) එක් කෝනල් ඇන්ඩ් කම්පනි ලිමිටඩ් සමාගමේ නාමික අධ්‍යක්‍ෂවරයෙකු ලෙස අධ්‍යක්‍ෂ මණ්ඩලයට විත්තිකරු පත්කරන ලදි. විත්තිකරුව අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත් කිරීමෙන් අනතුරුව ඔහු පැමිණිලිකාර සමාගමට ප්‍රධාන මූල්‍ය උපදේශකයා ලෙස කටයුතු කිරීම ආරම්භ කරන ලදි. සහ/හෝ පැමිණිලිකාර සමාගම වෙනුවෙන් එලෙස කටයුතු කිරීමට එකඟ වන ලදි. සහ/හෝ එසේ යයි නියෝජනය කරන ලදි. පැමිණිලිකාර සමාගමට අදාල සියලු මූල්‍ය කරුණු විත්තිකරු විසින් මණ්ඩලයට වාර්තා කරනලදී.

(ඇ) පැමිණිලිකාර සමාගම විසින් විත්තිකරුට සහ ඔහුගේ භාර්යාවට එකක් රු.10/- බැගින් වූ කොටස් 100,000 ක් විභාජනය කල අතර ඒ සඳහා ගෙවීම් කරන ලද්දේ කෝනල් සහ සමාගම විසින්ය.

(ඈ) කෝනල් සහ සමාගමේ ප්‍රධාන උපදේශකයා විත්තිකරු වූ අතර කෝනල් සහ සමාගමේ හිල්ටන් ව්‍යාපෘතියට අදාල සියලු කාරණා විත්තිකරුගේ උපදෙස් මත ක්‍රියාත්මක කරන ලදි. විත්තිකරු විසින් කෝනල් සහ සමාගමට එවන ලද 1980 මැයි 14 දින දරණ ලිපියේ සහ මහජන බැංකුවට යවන ලද 1980 නොවැම්බර් 03 දින දරණ ලිපියේ පිටපත් පිළිවෙලින් "x5" හා "x6" වශයෙන් ලකුණු කොට මේ සමග කොටස් ලෙස ගොනු කර ඇත.

(ඉ) විවරණිකාව සහ ලාභදායකත්වයට අදාල මුදල් ලගාකර ගැනීමේ ප්‍රකාශ පිළියෙල කිරීමට අදාල සියලු කරුණු සකස් කරන ලද්දේ හා කොන්ත්‍රාත්කරුවන් හා ගෘහ නිර්මාණ ශිල්පීන් සමග සම්බන්ධීකරණය කරන ලද්දේ විත්තිකරු විසින්ය.

(ඊ) අසාර්ථක වූ කෝනල් සහ සමාගම වෙනුවෙන් මත්පැන් බල පත්‍රයක් සඳහා ද විත්තිකරු විසින් අයදුම්පත්‍රක ඉදිරිපත් කරන ලදි. විත්තිකරු විසින් අත්සන් කරන ලද සුරාබදු කොමසාරිස්ට යැවූ 1983.01.26 දින දරණ ලිපියේ පිටපතක් "x7" වශයෙන් ලකුණු කොට කොටසක් ලෙස මීට අමුණා ඇත.

5 පිට...

(උ) කෝතල් සමූහ ව්‍යාපාරයේ සියලු සමාගම් විත්තිකරු විසින් මුළුමනින්ම අපලාපනය කරනු ලැබූ අතර ඉන් බොහොමයක් දැන් ඇවර කර ඇත.

(ඌ) විත්තිකරු විසින් "ඩී2" වශයෙන් ලකුණු කර ඇති ටෙලෙක්ස් පණිවිඩයද විත්තිකරුගේ අවධානය සඳහා යැවූ අතර, එම කරුණ ඉතා හදිසි යැයිද එහි සඳහන් කර ඇත. වෘත්තිමය කළමනාකරු වශයෙන් හා විශේෂයෙන් ආදායම් බදු උපදේශකයින් වශයෙන් සේවය කරමින් සිටියදී එවැනි කාරණා ගැන කටයුතු කරන බවට මණ්ඩලයට නියෝජනය කර හා එකඟ වී තිබිය දී ඒ ගැන වැඩකටයුතු කිරීම විත්තිකරු මුළුමනින්ම නොසලකා හැරියේය.

06. උත්තරයේ 10, 11 හා 12 ඡේදවල අන්තර්ගත සම්ප්‍රකාශ වලට පිළිතුරු සපයමින් ඒවා අපලාපනය කරන පැමිණිලිකරු "ඩී2" වශයෙන් ලකුණු කරන ලද ටෙලෙක්ස් පණිවුඩය මගින් විත්තිකරුට සපයා දෙනු ලැබූ තොරතුරු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමේ වගකීම විත්තිකරු සතු වූ බව කියා සිටී. ඒ සම්බන්ධයෙන් විගණකවරුන්ට දැනුම්දීමේ වගකීම විත්තිකරුගේ වගකීම විය. 1987 දී පවා ණය ගිවිසුම මත පොලිය ගෙවීමට අදාල කටයුතු වල විත්තිකරු නියැලෙමින් සිටියදී දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය නිදහස් කිරීම් ලබා ගැනීමට විත්තිකරු නොසලකා හැරියේය. පැමිණිලිකාර සමාගමේ 1987 ජුලි 15 වන දින පැවැත්වූ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර්තාවේ සත්‍ය පිටපතක් "x8" වශයෙන් ලකුණුකොට මීට අමුණා ඇත.

07. උත්තරයේ 13, 14, 15, 16, 17, 18, 19, 20, 21, 22, 23, 24 හා 25 වන ඡේදවලට පිළිතුරු සපයමින් 3155/එස්.පි.එල්. සහ 3231/එස්.පි.එල්. දරණ නඩු පැවරූ බව පමණක් පිළිගනිමින් ඒවායේ අන්තර්ගත සම්ප්‍රකාශ අපලාපනය කරන අතර මෙම නඩුවේ අරමුණ සඳහා එකී නඩුව මුලුමනින්ම අදාල බව කියා සිටී. පැමිණිලිකරු තවදුරටත් කියා සිටින්නේ,

(අ) විත්තිකරු විසින් එම නඩුව පවරා ඇත්තේ කොන්ත්‍රාත්කරුවන් විසින් කාමර 387 ක් පමණක් සාදා තිබියදී හෝටලයේ කාමර 456 ක් තිබිය යුතු යැයි ද මුදල් ලබාගැනීමේ ප්‍රකාශයෙහි කාමර 456 ක් පදනම් කරගෙන ඇතැයිද කියන රතිය ව්‍යුත්පන්න නඩුවක් පදනම් කරගෙනය.

(ආ) මුලු ක්ෂේත්‍රවලයේ වර්ග මීටර් 40,000 ක් පමණ බව විත්තිකරු හොඳින් දැන සිටි බවත් සත්‍ය වශයෙන්ම කාමර "බේස්" (room bays) කාමර දෙකකින් සමන්විත රූම් 'බේස්' වලින් සමන්විත සම්මන්ත්‍රණ කාමර, සාමාන්‍යාධිකාරිගේ සහ අමුත්තන්ට විකිණිය හැකි රූම් "බේස්" කිහිපයකින් සමන්විත අතිකුත් නේවාසික නිවාසස්ථාන යන ඒවායින් සමන්විත රූම් "බේස්" 387 ක් තිබේ. මෙය 1984 ජනවාරි 31 දින දරණ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට එකඟ වන අතර එහි මුල් පිටුව x9 ඒ වශයෙන් ද 2 වන පිටුව 'x9බී' වශයෙන් ද ලකුණු කොට මේ සමඟ කොටසක් ලෙස ගොනු කර මෙහිම කොටස් වශයෙන් අයැද සිටිනු ලැබේ. විත්තිකරු විසින් මෙම කාරණාව අවබෝධ කරගත යුතුව හා මුල් අවධියේදී අධ්‍යක්ෂ මණ්ඩලයට දැන්විය යුතුව තිබූ නමුදු ඔහු එය නොසලකාහැර මුදල් ගලා ඒමේ ප්‍රකාශ කාමර යතුරු 452 පදනම මත ඉදිරිපත් කරන ලදි. 1985 ජූලි 28 වන දින ඇතුලත් වූ අභ්‍යන්තර සැලසුම් ගිවිසුමද යොමු කර ඇත්තේ සමහර කාමර 'බේස්' සම්මන්ත්‍රණ කාමර ආදිය වශයෙන් මිස ආගන්තුකයින්ගේ කාමර වශයෙන් නොවන බැවින් ද සමහර රූම් 'බේස්' වලට කාමර 395 ක් පමණකි. විත්තිකරු අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීමේදී මේ තොරතුරු කිසිවක් සැලකිල්ලට ගෙන නොමැත.

(ඇ) එකී නඩු විභාගයට ගතහොත් ඒවා නිෂ්ප්‍රභා කරනු ඇති බව පැමිණිලිකරුට ස්ථිරය. විත්තිකරු විසින් නඩු පැවරීමට පෙරාතුවම ජපාන ණය දෙන්නන් සමග සාකච්ඡා පවත්වා ණය මුදල ඇ:ඩො:60 දක්වා අඩු කොට එම නියම කරන ලදි.

(ඈ) මැතදී විත්තිකරු පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරනු ලැබ සමාගමට එරෙහිව ප්‍රති ඉල්ලීමක් ඉදිරිපත් කොට මේ දෙක අතර අයිතිවාසිකම් පිළිබඳ නිශ්චිත ගැටළුවක් තිබෙන බැවින් විත්තිකරු මෙම සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් නොකල යුතුව තිබුණි. කෙසේ වෙතත් විත්තිකරු විසින් ඉහත දක්වා ඇති නඩු දෙක පවරා, නුදුසුදු වී පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු නොකල යුතුව තිබේ.

10 පිට....

(ඉ) කොළඹ දිසා අධිකරණ නඩු අංක 3155/එස්.පී.එල්. දරණ නඩුවට පැමිණිලිකරු විසින් ගොනු කර ඇති පැමිණිල්ල සහ ඔහු පැමිණිලිකාර සමාගමේ ප්‍රධාන මූල්‍ය උපදේශක වීම යන කරුණු විත්තිකරු විසින් යටපත් කොට ඇත. එකී පැමිණිල්ලේ පිටපතක් 'x10' වශයෙන් ලකුණු කොට මීට අමුණා ඇත.

08. උත්තරයේ 26, 28, 29, 30, 31, 32, 33 සහ 34 ඡේදවල අන්තර්ගත සම්ප්‍රකාශ අපලාවනය කරන පැමිණිලිකරු එකී සම්ප්‍රකාශ අදාල බවත් කෙසේ වෙතත් එහි දක්වා ඇති සහන වලට විත්තිකරු හිමිකම් නොලබන බවත් කියා සිටී. 10949/එම් සහ 12978/එම් දරණ නඩු කොළඹ දිසා අධිකරණයේ විමසීමට භාජනය වෙමින් තිබෙන බව පැමිණිලිකරු පිලිගනී. තවදුරටත් පිළිතුරු සපයමින් අංක 3155/එස්.පී.එල් දරණ නඩුවට පෙනී සිටි විත්තිකරුගේ අධිනීතිඥවරයා වන ජනාධිපති නීතිඥ කනගේෂ්වරන් විසින් එම නඩුවේ පැමිණිල්ල කෙටුම්පත් කල බවත්, අංක 10949/එම්.ආර්. දරණ නඩුව අයිතිවාසිකම් පිළිබඳ ගැටුන බැවින් අධිනීතිඥවරයා මාරු කිරීමට සිදුවූ බවත් පැමිණිලිකරු කියා සිටී.

එසේ හෙයින් පැමිණිලිකරු ආයාචනා කරන්නේ:

(අ) ඊනියා ප්‍රති ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ලෙසත්,

(ආ) පැමිණිල්ලේ ආයාචනය කර ඇති පරිදි විත්තිකරුට එරෙහිව නඩු තීන්දුව හා තීන්දු ප්‍රකාශ ඇතුලත් කරන ලෙසත්,

(ඇ) නඩු ගාස්තු අය කර දෙන ලෙසත් සහ

(ඈ) මෙම අධිකරණයට උචිත යයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන සලසා දෙන ලෙසත් ය.

CERTIFIED AS TRUE COPY

පැමිණිලිකරුගේ නීතිඥ.

HUSSAIN AHAMED
Attorney-at-Law